# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1901/15 - 2015 පෙබරවාරි මස 11 වැනි බදාදා - 2015.02.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

### බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව

2015 වර්ෂය සඳහා සම්මත අතුරු ව්‍යවස්ථාව වැළඳ ගැනීම

**සම්මත අතුරු ව්‍යවස්ථා පිළිගනු ලැබූ බව ප්‍රකාශයට පත් කරන ලද ගැසට් නිවේදනයේ ආදර්ශය**

1952 අංක 6 දරන පළාත් පාලන ආයතනය (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව 261 වන අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (i) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව විසින් 2014 වර්ෂයේ දෙසැම්බර් මස 16 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. එම්. විජේදාස,<br>
සභාපති,<br>
බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව.

2014 දෙසැම්බර් මස 16 වැනි දින,<br>
බඩල්කුඹුර ප්‍රාදේශීය සභාවේ දී ය.

1A - PG 2327— 10 (2015/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

යෝජනාවයි.

1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන වගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 සිට 126 දක්වා වූ වගන්තිවලින් 261 වන අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ ඌව පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඌව පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදනු ලදුව 2013.06.28 අංක 1816/43 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ (iv)(අ) කොටස් පළ කරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරනු ලද්දා වූ ප්‍රාදේශීය සභා වල සම්මත අතුරු ව්‍යවස්ථා/සම්මත අතුරු ව්‍යවස්ථා වල අංක 01 සිට අංක 23 දක්වා වූ කොටසක්වල දැක්වෙන සම්මත අතුරු ව්‍යවස්ථාව මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට ක්‍රියාත්මක කිරීමට පිළිගැනීමට සහ එකී අතුරු ව්‍යවස්ථා වැළඳ ගෙන ක්‍රියාත්මක කළ යුතු බවට ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) උප වගන්තිය යටතේ බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

ආර්. එම්. විජේදාස,
සභාපති,
බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව.

2014 දෙසැම්බර් මස 16 වැනි දින,
බඩල්කුඹුර ප්‍රාදේශීය සභාවේ දී ය.

---

11. යෝජනාව සම්මත අතුරු ව්‍යවස්ථාව වැළඳ ගැනීම

2013 ජුනි මස 28 වැනි දින අංක 1816/43 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කර ඇති 1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනත සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනතින් පැවරී ඇති බලතල ප්‍රකාරව පළාත් පාලන අමාත්‍යවරයා විසින් පනවන ලද අතුරු ව්‍යවස්ථා 23 වැළඳ ගත යුතු බවට යෝජනා කරමි.

ආර්. එම්. විජේදාස,
සභාපති,
බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව.

2014 දෙසැම්බර් මස 16 වැනි දින,
බඩල්කුඹුර ප්‍රාදේශීය සභාවේ දී ය.

01-708

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.